# සොයුරියගේ හැඟීම්



*එහෙම සහභාගී උන උත්සවයකට පසු මමත් ගෙදර ඇවිත් පරණ ඇල්බම් පෙරලලා අපේ පරණ ලංකාවේ ෆොටෝ-ස් බැලුවා. ඒ දවස්වල අපි ඇඳපු හැටි, ෆෝටෝස් වලට පෙනී ඉඳලා තියෙන විදිහ අප විවාහ මගුල් දවසේ නෑ හිතවතුන්ගේ ඇඳුම් පැළඳුම් කරලා තියෙන දේවල් ඇත්තටම ඇතිවුනේ හාස්‍යය මුසු අහිංසක සතුටක්. ඒක නිකං අර 70 දශකයේ චිත්‍රපට වල මාලනීලා, ජානකීලා මිනි ගවුම් ඇඳගෙන සිංදු කියන දර්ශනයක් දැන් දැක්කම අපිට ඇතිවෙන හාස්‍යය මුසු සතුටක් වගේ හැඟීමක්.*

**වසන්ත** සෘතුව ඇරඹුනා. සීත කාලේ නිදිබරව තිබූ ගස් වැල් පවා පිබිදෙන්න පටන් අරන්. පරිසරයේ වෙනස කොපමණ ඇඟට දැනෙනවද අපේ චර්යා රටාවනුත් පරිසරයේ වෙනස්වීමට අනුගත වෙන හැටි අපි නොදැනුවත්වම. මේ දවස්වල දවස ඇරඹෙන්න එළිය වැටෙන්නෙත් බොහොම කලින්. එලාම් එක තියලා උදේ පහට නැගිට්ටත් දැනෙන්නේ උදේ 7 වගේ. එනිසා දැන් කල්පනා කරන්න, හිතන්න, අමතර කාලයක් ලැබිලා.

ඉබේම දහසකුත් එකක් ප්‍රශ්න හිතේ දරාගෙන රාත්‍රී නින්දට යන අපි උදේ අවදිවෙන්නේ බොහොම නැවුම් මනසකින්න්. ඒත් ඒ මනස යළිත් බොහොමයක් දේ වලින් පිරෙන්න වැඩි වේලාවක් යන්නේ නැති බව අපි කවුරුත් දන්න සත්‍යයක්නේ. නිවාස ණය, කවුන්සිල් ටැක්ස්, වාහන ලියාපදිංචි කිරීම්, ලයිට්, වතුර, ගෑස්, දරුවන්ගේ අමතර පංති ගාස්තු මේ හැම දෙයක්ම ඉස්සර ලංකාවේදී වගේමයි. ඒත් ඉතින් අපිට ගෙයක් දොරක්, වාහනයක් තියෙනවානේ සැනසෙන්න. අර සිනමා රංග ශිල්පී ශ්‍රීනාත් ලංකාවේ පත්තරයකට කියලා තිබුනා වගේ අපි හැමෝම සැපට දුක් විඳිනවා. ඇත්ත තමයි හැම දෙයක්ම බර ටිකෙන් ටික අපට වෙනදට වගේ දැනෙනවා. ඒක නිසා අපි නිතරම කියන්නේ ඉස්සර නම් මෙහෙම නැහැ කියලා. "Good Old Days" අපගේ සේවා ස්ථානයේ මැදිවියේ ඔසී ජාතිකයන් නිතරම කියන දෙයක්. හැමෝටම හොඳ අතීතයම තමා. ඒත් ඉතිං ජීවත් වෙන්න තියෙන්නෙ වර්තමානයේනේ.

මේ අතීතය ගැන කියන්න නැවත හිතුනේ පසුගිය දිනවල ලබපු අත්දැකීම් නිසා. අපේ මෙල්බන් ජනතාව කාලෙන් කාලෙට මොනවා හරි අළුත් දේවල් කරනවනේ. ඉතින් මේ දවස්වල බොහොම ජනප්‍රිය සිඝ්‍රයෙන් විකාශනය වෙන උත්සවය තමයි පනහේ පාටි. නැතහොත් අපේ දයාබර සැමියන්ගේ වසර 50 ක් සපිරෙන උපන් දින උත්සවය. මේක සාමාන්‍යයෙන් අපිට හුරු දෙයක් නෙවේනේ. අපි කලේ අපේ දරුවන්ගේ උපන් දින සමරන එක විතරනේ. ඉදල හිටලා වැඩිහිටි කෙනෙකුගේ උත්සවයක් තිබුනේ. දරුවන්ගේ උපන් දිනවලදී වැඩියෙන් සතුටු වෙන්නේ එකතු වෙන දෙමව්පියෝ බව වෙනම කතාවක්. දැන් මේ සම්ප්‍රදාය නිසා වැඩිහිටියන්ට හොඳ ඉඩක් ලැබිලා තිබෙනවා. තමන්ගේ අර්ධ ශතක ජීවිත ගමන සමරන්න.

මට නම් හිතෙන්නේ මේක හොඳ දෙයක් සීමාවක් ඇතිව කරනවා නම්. දැන් දැන් මේක බොහොම අංග එකතු වෙමින් දියුණු වෙමින් ඉදිරියට යනවා. මුලින්ම කීපදෙනෙක් එකතුව කෙරුණු දේ සඳහා අති විශාල ශාලාවක් අවශ්‍යයි. ඒ සඳහා කෑම බීම අවශ්‍යයි. එන අමුත්තන්ව පිනවීමට සංගීතය අනිවාර්යයි. නවතම අංගය පවුලේ වීඩියෝ දර්ශනයක් ඉදිරිපත් කිරීම. මට නම් හිතෙන්නේ මේ සේරම අංග වල කිසි වරදක් නැහැ කියලා. මොකද අපේ බොහොමයක් දෙනෙක් ඉන්නේ දැන් විසිරිලා දැනට වසර 10 කට කලින් තිබූ සුහදතාවයන් එකමුතුකම දැන් අඩුයි. බොහෝ මයක් දෙනා මුන ගැහෙන්නේ බැච් පාටි එකකදී හෝ සිංහල අවුරුදු උත්සවයේදී පමණයි. මේ වගේ දෙයකදීවත් විසිරිලා ඉන්න අපේ මිතුරන් එකට ඉගෙන ගත්ත, එකට වැඩ රාජකාරි කල අපේ හිතවතුන් එකතු වෙනව නම් බිඳී ඇති මිතුදම් හිතවත්කම් අළුත් කරන්න හොඳ අවස්ථාවක් වේවි.

මේ අනිත් කරුණ නම් මා දුටු මේ උත්සවයේදී දැන් නොවරදින අංගය වන පවුලේ වීඩියෝ දර්ශනය. ඇත්තටම ඒක තමයි මට නම් හිතෙන්නේ වැදගත්ම අංගය. මොකද මෙහේ වාසය කරන අපි බොහොමයක් දෙනා අඩුම තරමේ වසර 25 හෝ 35 ක් වත් ශ්‍රී ලාංකික අතීතයක් තිබුන අය. ඒත් මේ බොහොමයක් දෙනා දැන් ජීවත් වෙන්නේ අපිට එහෙම අතීතයක් නොතිබුණ විදිහටයි. අපි විඳපු දුක් අඟහිඟකම් දුෂ්කරතා දැන් හුඟ දෙනෙකුට මතක නැහැ. බොහොමයක් දෙනා තමන් සාමාන්‍ය පවුල් පසුබිමකින් පැමිණි බව අඟවන්න කැමතිත් නැහැ. එහෙම ඉන්න මේ අපේම අයට, හුඟදෙනෙක් එකතු වෙන මොහොතක වසර 25 කට 30 පමණ පෙර අපි හිටපු තත්ත්වය, ඇඳුම් පැලඳුම්, විවාහ උන හැටි දැක ගන්න සලස්වන එක නම් හරි වැදගත්. ඒ නිසාම බොහෝ දෙනෙකුට නොකිව්වත් තමන්ගේ අතීතයන් මතක් වේවි. තමන්ගේ අතීතයේ නොසඟවන පිරිසක් ඉදිරියේ පෙන්වන එකත් අගයන්න වටින කාරණාවක්. ඇත්තටම එහෙම සහභාගී උන උත්සවයකට පසු මමත් ගෙදර ඇවිත් පරණ ඇල්බම් පෙරලලා අපේ පරණ ලංකාවේ ෆොටෝ ස් බැලුවා. ඒ දවස්වල අපි ඇඳපු හැටි, ෆෝටෝ ස් වලට පෙනී ඉඳලා තියෙන විදිහ අප විවාහ මඟුල් දවසේ නෑ හිතවතුන්ගේ ඇඳුම් පැළඳුම් කරලා තියෙන දේවල් ඇත්තටම ඇතිවුනේ හාස්‍යය මුසු අහිංසක සතුටක්. ඒක නිකං අර 70 දශකයේ චිත්‍රපට වල මාලනීලා, ජානකීලා මිනි ගවුම් ඇඳගෙන සිංදු කියන දර්ශනයක් දැන් දැක්කම අපිට ඇතිවෙන හාස්‍ය මුසු සතුටක් වගේ හැඟීමක්. සමහර දේ දැක්කම දැන් හිනාව නවත්ත ගන්නත් බැහැ.

හැමදේකම ඉතින් හොඳ වගේම අනිත් පැත්තත් තියෙනවා. මට නම් හිතෙන්නේ අපි මේ හැම හොඳ දේම කල යුත්තේ අපේ සීමාවේ ඉඳගෙන. මේකත් තරඟයක් කර ගන්න නම් නරකයි. සතුටේ තිබිය යුත්තේ සාමානාත්මතාවයක් මිසක් තරගයක් නොවෙයි. රටට ජේන්න ණයට මඟුල් කනවා වගේ වැඩක් නම් මේ සම්ප්‍රදායට සිදු නොවේවායි කියා මා හිතනවා. මාත් එක්කම මේ උත්සවවලට සහභාගී වෙන මිතුරියක් නම් කිව්වේ තව කල්පයක් ගියත් තාත්තලට ලැබුන මේ අවස්ථාව අම්මලා නම් ගන්න එකක් නැහැ කියලා. තොරන් බැඳලා මල් වෙඩි ගහලා උත්සවයක් සූදානම් කරල දුන්නත් එකේ නම් සත්‍යයක් තියෙනවා තමයි. ඒ වගේම අපේ ජයේ කියන්නේ ශාලාවකුත් අරගෙන සංගීතෙත් සපයලා බොන්නත් දීලා අපි මොනවාද වීඩියෝ දර්ශනේදී පෙන්නන්නේ කියලා. ඇත්ත තමයි ඒ වගේ කට්ටිය කොච්චර ඇද්ද. පෙන්නන්න දෙයක් නැති උනත් ඇත්තටම ඒ අතීතය මොනතරම් සුන්දරද? මිහිරිද? සත්තකින්ම old days good ම තමා.

**සොයුරිය ධරනී**




## බාල වර්ගය

**අනුවණයා අසාව නිසා පෙළේ**

සැවැත් නුවර දෙව්රම් වෙහෙරේදී ආනන්ද සිටු වෙනුවෙන්.

පුත්තා මත්ථි ධනම්මත්ථි
ඉති බාලෝ විහඤ්ඤති
අත්තා හි අත්තනෝ නත්ථි
කුතෝ පුත්තා කුතෝ ධනං

මට දරුවන් ඇත, මට මහා ධනය ඇත.
අනුවණයා මෙසේ සිතුවත්,
තමාට තමාවත් නැති කොට,
දරුවෝ කොයින්ද?, ධනය කොයින්ද?

Putta m'atthi dhanam m'atti
iti balo vihannati
atta hi attano natthi
Kuto putta kuto dhanam

Sons have I, wealth have I,
thus is the fool worried.
Verily, himself is not his own.
Whence sons? Whence wealth?

සැවැත් නුවර ආනන්ද නම් සිටුවරයෙක් සිටියේ ය. මහා ධනස්කන්දයක් තිබුනත් ඔහු මහ මසුරෙක් වූහ. මේ සිටු හට මූලසිරි නම් පුතෙක් සිටියේ ය.

පුතුට ඔවදන් දෙන පියා කියා සිටියේ "ධනය මෙපමණ ඇතැයි නොසිතන්න. තව තවත් ධනය උපයන්න". මෙසේ ඔවදන් දුන් පියා තමන්ගේ නිදන් කළ වස්තුවද නොපෙන්වා මියගොස් එනුවරම සැඩොල් කතකගේ කුස පිළිසිඳ ගත්තේ ය. මූලසිරි නම් සිටු පුතුට කොසොල් රජු වෙතින් සිටු තනතුරක් ලැබුවත් ඔහුද පියාගේ ඔවදන් අනුව මහ මසුරෙක් ලෙසින් දිවි ගෙවයි.

මේ ආනන්ද සිටු සැඩොල් කුලයේ ඉපදුන තැන් පටන් ඒ සැඩොලුන් හට පෙර මෙන් ලාභ නොලැබී ගියේ ය. ආහාරද හිඟ විය. ඒ සැඩොලුන් විසින් තමන් අතර නිසරු අයෙකුගේ ඉපදීමක් ඇතැයි සිතා ඔවුහු කොටස් වශයෙන් බෙදී ඒ නිසරු පුද්ගලයා තෝරා ගෙන ඒ විපතින් මිදුණා හ. සැඩොල් කුලයේ උපන් ඒ ආනන්ද සිටුහුගේ ඇස කණ නාසය කට මුහුණ අත පය නිසි ලෙස නොපිහිටියා හ. දැකුමට බියකරුය. කෙසේ වෙතත් වැදූ මවගේ සෙනෙහසින් ඒ පුතු යන්තම් වැණූ පසු හිඟමන් යදිනට භාජනයක් දී සිඟා කා දිවි රැක ගනු යැයි පවසා මුදා හැරියේ ය. සිඟා කා ජීවත් වෙන මේ ආනන්ද සිටු
ඔහුගේ පෙර මැදුරට යයි. එහෙත් කිසිවක් නොලැබේ. ඒ මැදුරෙහි දන් දෙන අය නැත. මේ ආනන්ද සිටුහුගේ ක්‍රමයයි.

මූලසිරි සිටුහුගේ දරුවෝ (ආනන්ද සිටුහුගේ පුතාගේ දරුවෝ) මේ සැඩොල් කොලුවා දැක බිය වී හඬන විට මෙහෙකරුවෝ ඔහුට පහර දී එලවා දමයි. ලොව බලන බුදු පියාණන් වහන්සේ මේ සිදුවන විපත දැක මූලසිරි සිටු මාලිගයට වැඩ මේ ඔබේ පියා ආනන්ද සිටු යැයි වදාළ සේක. ඒ බැව් ඔප්පු කිරීම පිණිස පෙර අත් බැව්හි සඟවන ලද ධනයද පෙන්වා දුන්හ.

තමාගේ පියා පත් විපත දැක මූලසිරි සිටුහු බොහේ කුසල් කර ගත්හ. මේ සිදුවීම හේතුකොට ගෙන බුදු පියාණන් වහන්සේ "අනුවණ තැනැත්තා මට දරුවෝ ඇත, ධනයද ඇතැ යි වෙහෙසෙතත් පෙලෙත ත් තමාවත් තමාට නැති කල දරුවෝ වත් ධනයවත් කොයින්දැ"යි වදාළ සේක.

# සුභාෂිතයෙන් ...

**කිවි පද බැඳුම් ගුන දොස් කිවිඳුන් ම මිස**
**නැන මඳ කුකුවි දන ගත හෙති කමර ලෙස**
**දරු ලද අඟනන් ම මිස පසවෙහි වෙහෙස**
**වඳ ලද ගනෝ දැන ගත හෙති කවර ලෙස**

කිවි පද බැඳුම් ගුන දොස් කිවිඳුන් ම මිස නැන මඳ කුකවි
කවර ලෙස දැන ගත හෙති? දරු ලද අඟනන්ම මිස පසවෙහි
වෙහෙස වඳ ලද අගනෝ කවර ලෙස දැන ගත හෙති?

කිවි පද බැඳුම් ගුන දොස් - කවීන්ගේ (ප්‍රබන්දවල) කවිවල හොඳ - නරක, කිවිඳුන්ම මිස - දක්ස කවීන් ම මිසක්, නැත මඳ කුකවි - නුවන අඩු (මෝඩ) බොරු කවියෝ (නමට කවියෝ), කවර ලෙස දැන ගත හෙති?. කෙසේ දැන ගනිද්ද?, දරු ලද අඟනන්ම මිස - දරුවන් වැදූ (ලැබූ) අගනුන්ම මිසක්, පසවෙහි වෙහෙස - (ප්‍රසවයෙහි) දරුවන් වැදීමේ වෙහෙස (දුස්කරතාව), වඳ ලද අගනෝ - වඳ ගැහැනු නොහොත් තරුන ගැහැනු, කවර ලෙස දැන ගත හෙති? කෙසේ දැන ගනිද්ද?

මේ කවියා කිසිවකු මෙම පොත විවේචනය කරනවාට කැමති නැත. ඔවින් පසු බස්සනු පිනිස අදිරිමත් කරනු පිනිස ඔහු මෙම කවිය ලියා ඇත. කෙසේ වෙතත් ''දැන ගත හෙති කවර ලෙස'' යන කඩවැකිය එක් ම කවියේ දෙපලක යෙදීම හපන් කවියන් අතින් නොකෙරෙන බව කිව යුතුය.

කුලුඳුල් දරුවාගෙන් පසවෙහි වෙහෙස දන ගත්තත් සමහර ලන්දු / අඟනෝ දරුවන් දහ දොලොස් දෙනකු ලැබෙන තෙක් එම කාරියේ යෙදෙති. වඳ ලඳුන් දරුවන් පතා සිවලිංගයේ පිහිට පතන බව දනිමි. තරුන ලන්දු මව් තනතුර ලැබෙන තෙක් ඇඟිලි ගනිති. ඇත්තට ම පසවෙහි වෙහෙස දැන ගත නොහැක්කේ පිරිමි සතුන්ටය.
කුමාරතුංග මුනිදාස පඬිවරයා ''ළඳ අඟනෝ'' යනුවෙන් මූර්ධජ 'ළ' යන්නකුත් සංඥක 'ඳ' යන්නකුත් තම පොතේ ලියා ඇත. එතුමා එකම පිටුවේ තුන් පලකම එය ලියා ඇත. කෙසේ වත් එය වැරදීමක් ලෙස සැලකීමට සිදුවේ. ගැහැනු සහ තරුන යන තේරුම් දෙකම දීම සඳහා 'ළඳ' යන්න එතුමා බහවිතා කරතැයි සිතිය නොහැකි ය. සඳගෝමි කෝපරහේවා සූරීන් ඇතුලු බොහෝ දැනුම් ඇත්තෝ ළඳ - ගැහැනු, ළඳ - තරුන බව කියති. එහෙත් ජාතික අධ්‍යාපනායතනය සකසා ඇති ''සිංහල ලේඛන රීතියේ'' ළඳ සහ ළද' සදොස් බවත් 'ලඳ සහ ලද' ම නිදොස් බවත් සඳහන් වේ. දැන් මට ඒ කොයි විදියත් එක ය. (ළඳ ළඳ - ලඳ ලඳ - ළඳ ළද -ළඳ ලද - ලඳ ලද - ලඳ ලඳ)

දැන් මා න/ණ දෙකම සඳහා එක් 'න' යන්නකුත් ල/ළ දෙකම සඳහා එක් 'ල' යන්නකුත් ලියන බව ඔබ දනිතැයි සිතමි. මට තවම ශ/ෂ දෙකම සඳහා එක් 'ස' යන්නක් බහවිතා කිරීමට බැරිවීම ගැන දුක් වෙමි. මගේ ලියවිලිවල ඒ සඳහා ගැටයකින් අවසන් වන ('ශ' යන්නක් නොව)'භ' යන්නක් ලියමි. එය යතුරු පුවරුවට ගත නොහැකි ය.

**වි ක ධර්මබන්ධු**